**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2023**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ (“අධිකාරිය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරිය සම්බන්ධ ගනුදෙනු පිළිබඳ වාර්තාව 2024 දෙසැම්බර් 10 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගතකර ඇත. තවද පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ආයුගණක අලාභය වූ රු.958,888 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 114 ඡේදය ප්‍රකාරව වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වෙනම දැක්වීම වෙනුවට පාරිතෝෂික වියදමට එකතු කර දක්වා තිබුණි. | 2024 වර්ෂයට අදාළ අවසාන ගිණුම්වල නිවැරදි කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ආයුගණක අලාභ ගිණුම්වල දැක්විය යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ව්‍යාපෘතිය සඳහා 2024 ජනවාරි 18 දින මිලදී ගෙන තිබූ රු.548,785ක් වූ කැමරාව (Cannon EOS RP Mirrorless) සමාලෝචිත වර්ෂයේ දී පූර්ව වර්ෂ ගැළපීමක් ලෙස සමුච්චිත අරමුදලට ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | 2024 වර්ෂයේ අවසාන ගිණුම්වල නිවැරදි කර ඇත. | වර්ෂයට අදාළ ගනුදෙනු එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | Cluster Development Program යටතේ සමූපකාර සමිතියක් මගින් යොමු කළ බිම්මල් වගා පොකුරු සංවර්ධන වැඩසටහන සඳහා 2024 ජනවාරි 19 දින ලැබී තිබූ රු.1,000,000 ක අත්තිකාරමක් | 2024 වර්ෂයේ අවසාන ගිණුම්වල නිවැරදි කර ඇත. | වර්ෂයට අදාළ ගනුදෙනු එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ගෙවීමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා බැරකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | උපාධිධාරි ව්‍යවසායක උදානය - 2023 දෙවන අදියර සඳහා වූ සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.5,011,143 ක වියදම් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන්, අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් සහ ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ලබාදීමට සැලසුම් කළද, මුදල් නොමැතිකම හේතුවෙන් 2024 වර්ෂයේදී මුදල් ලබා දෙන ලදී . | වර්ෂයට අදාළ ගනුදෙනු එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු) | වෙනස (රු) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 35,337,444 | 26,673,472 | 8,663,472 | 2024 වර්ෂයේ අවසාන ගිණුම්වල නිවැරදි කර ඇත. | ගිණුම් ශේෂ, අනුරූපී වාර්තා සමඟ සසඳා මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සමඟ, එම අධිකාරියට සියයට 60 ක අයිතියක් සහිත පරිපාලිත සමාගම වන B – Express Ltd ආයතනයේ මූල්‍ය ප්‍රකාශනද ඇතුළත් කර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 26 අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු වුවත්, 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය පත් වූ වහාම 2024 වර්ෂය දක්වා ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| නොසැපයූ විගනණ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේදී ලබා දී තිබූ රු.255,250 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී පියවා තිබුණද, ඊට අදාළ බිල්පත් විගණනයට ඉදිරිපත් නොවූයෙන් අදාළ අත්තිකාරම් පියවීම්වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | අවශ්‍ය තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා ගෙන විගණනය සඳහා ලබා දීමට එකඟ වෙමි. | සියළුම ගණුදෙණු තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි පවත්වාගෙන යායුතු අතර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ පරිපාලිත සමාගමෙන් ලැබිය යුතුව පවතින රු.500,000ක වටිනාකම අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | මෙම මුදල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 වන වගන්තිය | අධිකාරිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අංක DMS/1574/Vol.II හා 2023/10/13 දිනැති ලිපිය මඟින් අභ්‍යන්තර විගණක තනතුරක් ඇතිකිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මේ වන විට රේඛිය අමාත්‍යාංශය හරහා අභ්‍යන්තර විගණක වරයෙකු වැඩ බැලීමේ පදනම මත බඳවා ගෙන ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කඩිනමින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් මාර්ගෝපදේශ යෙහි 6.6 වගන්තිය | 2023 ගිණුම් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2024 පෙබරවාරි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දින 488ක ප්‍රමාදයකින් පසුව 2025 ජූලි 02 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2025 වර්ෂයේ සිට නියමිත කාලය තුල මූල්‍ය ප්‍රකාශන ලබාදීමට කටයුතු කරනු ලැබේ. | නියමිත දිනට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 119 | අංක PD-6379 දරන කැබ් රථය 2020 වර්ෂයේදී සභාපතිවරයා විසින් ධාවනය කිරීමේදී ඇතිවූ දෝෂයක් අළුත්වැඩියාව සඳහා වැය වූ රු.498,110ක මුදල සභාපතිවරයාගෙන් අය කර ගත යුතු බවට මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කරන ලද පරීක්ෂණයෙන් නිර්දේශ කර ඇතත් එම මුදල අයකර ගැනීමට 2025 අගෝස්තු 10 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | කර්මාන්ත අමාත්‍යාංශය නීතිපති දෙපර්තමේන්තුව වෙත මේ සම්බන්ධව වාර්තා කොට ඇති අතර නීතිපති දෙපර්තමේන්තුව විසින් මේ සම්බන්ධව ක්‍රියාකර ගෙන යනබව දන්වා ඇත. තවද අධිකාරියෙන් ද මේ පිළිබඳව කරුණු විමසා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කරන ලද පරීක්ෂණවල නිර්දේශ අනුව අලාභ අයකර ගත යුතුය. |
| (ii) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මගින් සංශෝධිත | | | |
| | (1) මුදල් රෙගුලාසි 371(5) | අතුරු අග්‍රිමයන් ඒවා නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දින හෝ අදාළ කාර්ය නිම වී දින 10ක් තුළදී පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය | 2025 සැප්තැම්බර් මාසය අවසන් වීමට ප්‍රථම නොපියවා ඇති අත්තිකාරම් පියවීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කර දෙන ලද කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | තුල අවස්ථා 141කදී ලබා දී තිබූ එකතුව රු.1,018,809ක් වූ අත්තිකාරම්, ලබාගත් කාර්යය අවසන් කර ඇතත් 2025 ජුනි 30 දින වන විටත් පියවා නොතිබුණි. එසේම, 2017, 2018, 2019, 2021 සහ 2022 යන වර්ෂවල ලබාදුන් පිළිවෙලින් රු.338,250, රු.584,330, රු.400,072, රු.171,450 සහ රු.1,316,200ක් වශයෙන් එකතුව රු.2,810,302ක් වූ අත්තිකාරම් ද 2025 ජුනි 30 දින වනවිටත් පියවා නොතිබුණි. | | කළ යුතුය. |
| (2) මුදල් රෙගුලාසි 756 | අදාළ මුදල් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත යොමු කිරීම සිදු කළ යුතු වුවද, අධිකාරියේ 2023 සහ 2024 වර්ෂවලට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2025 සැප්තැම්බර් 10 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරියේදී විගණකාධිපතිවරයා වෙත භාරදීමට කටයුතු කරන අතර 2024 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ සිදුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත කාල සටහන අනුව භාණ්ඩ සමීක්ෂණ සිදු කර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,221,752 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,740,583 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,481,169 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පරිපාලන වියදම් රු.7,562,505 කින් හා වැඩසටහන් වියදම් රු.12,898,194 කින් වැඩිවුවද, පුනරාවර්තන ප්‍රදාන රු.10,991,869 කින් හා ප්‍රාග්ධන ප්‍රදාන රු.13,280,566 කින් වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් 2021 වර්ෂයේදී රු.9,600,000 ක් වැයකර මිලදී ගන්නා ලද වෙළඳ ද්වාරය විගණිත දිනය වූ 2024 ඔක්තෝබර් 10 දින වන විටත් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. | Made in Sri Lanka වෙළඳ ද්වාරය සම්බන්ධයෙන් පද්ධති විශ්ලේෂණයක් සිදු කර අඩුපාඩු හඳුනා ගන්නා ලදී. නියෝජිත ගිවිසුම කල් ඉකුත් වී ඇති බැවින් වෙළඳ ද්වාරය නඩත්තු කිරීමේ වැඩපිළිවෙල ආරම්භ කිරීමට හෝ Showcase Site එකක් ලෙස යළි නියෝජනය කිරීමට සැලසුම් කර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි වෙළඳ ද්වාරය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 13(ආ) සහ (ඉ) වගන්ති අනුව අධිකාරියේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමුකර ඊට අදාළ ක්‍රියාකාරකම් සැලසුම්කර නොතිබුණි. | | |
| (i) විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම. | 2019 වසරේ සිට ක්‍රියාත්මක වන “Made in Sri Lanka ” වෙළඳ ද්වාරය තුලින් දේශීය නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපොල වෙත ගෙන යාමට හැකියාව ඇත. | පනතේ අරමුණු ඉටු කර ගැනීමට සැලසුම් කර, සැලසුම් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම. | ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන පර්යේෂණ හා සංවර්ධනය මාකදුරේ පිහිටුවා ඇති පෙර වැඩුම් මධ්‍යස්ථානය මඟින් ඉටුකරවා ගත හැක. තාක්ෂණික සංවර්ධන අරමුදල පිටුවීමට කීප අවස්ථාවකදී උත්සාහ කළද මේවන විටත් පිහිටුවා නොමැත. | පනතේ අරමුණු ඉටු කර ගැනීමට සැලසුම් කර, සැලසුම් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ILO ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2023 ජුනි 13 වන දින ජාත්‍යන්තර කම්කරු ආයතනය සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය අතර ඇති කර ගන්නා ලද ගිවිසුමේ විධිවිධාන සලසා නොතිබියදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත පමණක් ව්‍යාපෘතියේ රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් නිලධාරීන් 13 දෙනෙක් සඳහා එකතුව රු.676,880 ක් වූ මාසික දීමනාවක් ව්‍යාපෘතිය මගින් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියෙහි රාජකාරි වෙනුවෙන් රාජකාරි වේලාවෙන් බැහැරව හා සති අන්තයන්හි සේවයේ යෙදුනු නිලධාරීන් වෙනුවෙන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගෙන මෙම දීමනාව ගෙවන ලදී. එසේම, ILO සහ NEDA අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුමෙහි වියදම් ඇස්තමේන්තුව තුළ ප්‍රවාහන වියදම් ප්‍රතිපූරණය කර ගැනීම යන ශීර්ෂය තුළ මෙකී වියදම් ඇතුළත් කරන ලද අතර ඒ සඳහා ILO අනුමැතිය හිමිව තිබු බැවින් මෙය අධිකාරී බලය ලත් ගනුදෙනුවකි. | ව්‍යාපෘති ඉටු කිරීමේදී ගිවිසුමේ කොන්දේසිවලට අනුගත විය යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උපාධිධාරි ව්‍යවසායක උදානය-2023 වැඩසටහන යටතේ සිසුන් 30 දෙනකු සඳහා රු.250,000 බැගින් ප්‍රතිපාදන ලබාදීමට සැලසුම් කර තිබූ අතර ඉන් 28 දෙනෙකු සඳහා පමණක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. එහිදි ප්‍රතිපාදන ලබාදීමට අනුමැතිය ලද ව්‍යවසායිකයින් දෙදෙනෙකු වෙනුවට ප්‍රතිපාදන සඳහා සුදුසුකම් නොලත් ව්‍යවසායකයින් දෙදෙනෙකු වෙත ප්‍රතිපාදන ලබා දී තිබුණි. | උපාධිධාරි ව්‍යවසායක උදානය දෙවන අදියර සඳහා මුදල් ලබාදීමට සැලසුම් කළද මුදල් නොමැති නිසා 2024 වර්ෂයේදි මුදල් ලබාදෙන ලදි. | සැලසුම් කළ කාර්යයන් සැලසුම් කළ පරිදි ඉටුකිරීමට කටයුතු කළ යුතුය. සුදුසුකම් නොලත් ව්‍යවසායකයන්ට ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යවසාය සංවර්ධන වියදම් ලෙස රු.25,703,580 ක් වැය කර තිබුණද, එක් එක් වැඩසටහන පැවැත්වූ ස්ථානය, දිනය, පුහුණුලාභීන් සංඛ්‍යාව, දරන ලද වියදම, ගෙවූ අත්තිකාරම්, එම අත්තිකාරම් පියවීම පිළිබඳ විස්තර හා පුහුණුලාභීන්ගේ ව්‍යවසාය සංවර්ධන ප්‍රගතිය වැනි සියළු තොරතුරු ලබා ගත හැකි වාර්තාවක් හෝ දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සියලු තොරතුරු ලබා ගත හැකි වාර්තාවක් හෝ දත්ත පදනමක් අදාළ අංශය තුළ පවත්වාගෙන නොතිබුණි. නමුත් සෑම වැඩසටහනකටම අදාළ සියලු විස්තර ඇතුළත් ගොනුවක් එක් එක් ව්‍යවසාය සංවර්ධන නිලධාරී භාරයේ පවතී. ඉදිරියේදී වාර්ෂිකව එම තොරතුරු ඇතුළත් කර ප්‍රගති වාර්තාවක් සකස් කිරීමටද සැලසුම් කර ඇත. | පවත්වන ලද ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් පිළිබඳ සියළු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත කර යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) අධිකාරිය සඳහා ISO සහතිකය ලබා ගැනීම සඳහා 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එකතුව රු.465,284ක මුදලක් වැය කර තිබුණද 2025 ජුනි 30 | මෙම කාලය තුලදී ආයතනය ස්ථාන කිහිපයකට මාරුවීම නිසා ISO ලබාගැනීමට අවශ්‍ය පරිසරය නැවත සකස් කර ගැනීමට සැලකිය යුතු | සැලසුම් කළ පරිදි ISO සහතිකය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දින වන විටත් ISO සහතිකය ලබා ගෙන නොතිබුණි. | මුදලක් දැරීමට සිදු වී ඇති අතර ISO වැනි සහතිකයක් ලබා ගැනීමට අධිකරියේ කටයුතු තව දුරටත් ක්‍රමවත් කර ගැනීමට අවශ්‍ය වේ. තවද මේවනවිට අප අධිකාරිය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා කුඩා ව්‍යාපාරය අංශය යන ආයතන එකාබද්ධ කොට තනි ආයතනයක් පිහිටුවීමට තීරණය කොට ඇත. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අප්‍රේල් 11 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක NP/IND/CM/16/02 යටතේ මාකඳුර කර්මාන්ත පුරයේ පෙරවැඩුම් තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයක් (Incubator and Technology Transfer Center) ලෙස කොටස් අයිතියෙන් සියයට 60 ක් අධිකාරියට හිමිවන අයුරින් සීමාසහිත සමාගමක් ලෙස 2017 වර්ෂයේදී සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද B Express Ltd නමැති සමාගම සඳහා 2017 වසරේ සිට 2024 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම කළමනාකරණය දැනුවත් කළද, විගණිත දිනය වූ 2025 අගෝස්තු 25 දිනය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නොතිබුණි. | අධිකාරියේ ගණකාධිකාරී විසින් 2024 දක්වා වර්ෂවල අවසන් ගිණුම් සකසන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය පත් වූ වහාම එම ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. | අනුබද්ධ සමාගම නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කරනු ලබන බවට මව් ආයතනය වගබලා ගත යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව වරලත් ව්‍යාපාර (franchise shops) මගින් අවම වශයෙන් සැපයුම්කරුවන් 25 දෙනෙකු හඳුන්වාදීමට සැලසුම් කර තිබුණද එකදු ව්‍යාපාරයක්වත් ආරම්භ කර නොතිබුණි. තවද made in Sri Lanka වෙළෙඳ ද්වාරය තුල අවම වශයෙන් සැපයුම්කරුවන් 1000 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල සැපයුම්කරුවන් 216 දෙනෙකු පමණක් ලියාපදිංචි කර තිබුණි. | පාර්ශවයක් සපයා ගැනීමට නොහැකි වීම හා 2023 වසරේ ප්‍රමාණවත් මුදල් නොමැතිකම හේතුවෙන් එම මුදල ඵලදායි කටයුතු සඳහා යොදවන ලදී. Made in Sri Lanka වෙළෙඳ ද්වාරය සම්බන්ධයෙන් පද්ධති විශ්ලේෂණයක් සිදු කර අඩුපාඩු හඳුනාගන්නා ලදී. | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා ළගාකර ගත හැකි ඉලක්ක ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු අතර සැලසුම් කළ ප්‍රගතිය ළගා කර ගැනීමට කටයුතු කළ යුතුය. |